තවත් එකක් මොණරෙක් විදියටත් කළා. නෙළුම් මලක්, බෝ කොළයක් විදියටත් සැළසුම් කළා. මේ වතාවේ පඩාචාරා කතාව අඳින්නේ මාළිගාවක් වගේ සැළසුමකට."

අප හට මංගලා මෙහිදී කළ රැකියාවක් පිළිබඳව ද අසන්නට ලැබිණ. එය ද ඇයගේ මේ කුසලතාවයට අදාල වූ රැකියාවක් විය.

"අපි මෙහාට ඇවිත් අවුරුද්දකට විතර පස්සේ මෙහෙ යාළුවෙක් යොමු කළා සුභ පැතුම් පත් නිර්මාණය කරන ආයතනයකට. ඒ ආයතනයේ නිර්මාණය කරන කාඩ් වල පින්තූර එන්ග්‍රේව් (අඩක් ඉහළට නෙරන සේ) කරන ඒවා. මගේ චිත්‍ර දැකලා ඇහුවා පුහුණුවකට එන්න පුළුවන්ද කියලා. මම කැමති වුණා. සුභ පැතුම් පත උඩ චිත්‍රය නෙරපලා උඩට ගන්න අච්චුවක් හදා ගන්න ඕන. ඒ අච්චුව විශේෂ වුණ තහඩුවක කපන්න ඕන."

ඊස්සර වෙලාම අදාල චිත්‍රය සවි කඩදාසියක මුද්‍රණය කරලා දෙනවා. ඒ චිත්‍රය අර ලෝහ තහඩුව උඩ තියලා කාබන් කොලයක උදව්වෙන් තහඩුවට පිටපත් කරගන්න ඕන. මේ තහඩු ඇළුමිනියම් ලෝහ තහඩුවක්. ඒත් කාබන් එකක් වගේ තහඩුවේ වැඳුනට,අපි ඒ චිත්‍රයේ අච්චුව කපන කොට චිත්‍රය ඇඳුන කොටස කැපිලා අයින් වෙනවනේ. ඉතින් ආය ආය අර සවි කඩදාසියේ ත්යෙන චිත්‍රය උඩින් තිය තියා බල බලා ඇඳ ඇඳ තමයි ඉතිරි ටික ආය කපාගෙන යන්නෙ."

"තහඩුව කපන්න උපකරනයක් තියෙනවා. පින්සලක් වාගේ එකක තුඩට හයි කරලා තියෙන්නේ යන්තානුසාරයෙන් කැරකෙන හීනි තලයක්. මේ පින්සලය වගේ කොටසේ ඉහළ කෙළවර වයර් එකකින් යන්ත්‍රයට සම්බන්ධ වෙලා තියෙන්නේ. ඒ එන විදුලිබලයෙන් තමයි අර හීනි තලය කරකැවෙන්නෙ. ඉතින් ඒ තලයෙන් තමයි ලෝහය කැපෙන්නෙ. මේකට තමයි එන්ග්‍රේව් කරනවා කියන්නේ. වෙනස් ප්‍රමාණ වල තල තියෙනවා. මේ අච්චුවට උඩින් තවත් කාඩ්බෝඩ් වර්ගයක් තියලා කිලෝ සීයක විතර බරත් යොදලා "ප්‍රෙස්" (තෙරපනවා). ඒ ගන්නා අච්චුව තමයි සුභ පැතුම් පත් වල චිත්‍රය නෙරපලා ගන්න යොදා ගන්නෙ. ඒ තෙරපුණ චිත්‍ර උඩ ඊට පස්සේ චිත්‍රය වර්ණයෙන් මුද්‍රණය කරනවා. චිත්‍රයේ "ඩීටේල්ස්"



(විස්තර) වැඩි වන තරමට කාලය වැඩියෙන් යනවා. ඒ වගේම සියුම් වැඩිවන තරමට අමාරුයි. ඉතින් අගල් "6x4" විතර තහඩුවක විස්තර වැඩි චිත්‍රයක අච්චුවක් කපන්න මට පැය 16 ක් විතර යනවා. ඒ වගේම ඒ අච්චුවක් ඩොලර් 300ක් 400ක් විතර වටිනවා.

"මට ඉතින් ඔය දේට මාස තුනක පුහුණුවක් කරන්න තිබුණත් මම ගොඩක් ඉක්මනින් හුරු වුණා. පස්සෙ මම ඒ ආයතනයේ අවුරුදු 7 ක් විතර වැඩ කළා. මගේ මේ ඇඟිල්ලෙ අමාරුවක් ආව නිසා ඒ රස්සාවෙන් අයින් වුණා." දැන් මංගලිකා සොනාලි දියණියත්, හේරුක පුතණුවන්ගේත්, සීවලී සැමියාත් වෙනුවෙන් කැප වී සිටින්නීය. ඇයගේ කලාගාරය වී ඇත්තේ නිවහනේ ගරාජයයි.

මුලදී ඇය හට අත දුන් ආචාර්ය සුනන්දා තිලකරත්න මහත්මියට පූජ්‍ය නා ඔටුන්නේ විජිත හිමියන්ට මෙන්ම තොරණ ඉදිකිරීමේදී ආලෝකකරණයෙන් සහය වෙන රසික අමරසිරි මහත්මයාටත්, නන් අයුරින් ඒ සඳහා සහය දෙන දයා සමරසිංහ මහත්මයාටත් ස්තුතිවන්ත වූවාය. ඇයගේ පාසැලේ චිත්‍ර ගුරුතුමිය, කොන්සි මහත්මියව ද ඇය සිහිපත් කළාය.

ඇයගේ රැකියාවට ඉවහල් වූ මූර්ති කලාව මුල් කාලයේම අත හැරීමට වූ සැටිත්, ඇයගේ නිසිස් හා කවි ලිවීමේ කලාව පිළිබඳවත් ඇය අප හා කතා කළේ ඒ එකතුව අප හට ද පෙන්වමිනි. කුඩා කාලයේ මුලින් ම බුදු පිළිමයක් ඇඹූ සැටිත් ඊට සිය මව අසතුට පළකර ගසක් මුදුනේ එය රඳවා පිළිම ඇඹීම නොකරන සේ අවවාද කළ සැටියත් රසවත් කතාවකි.

ගමේ ළිඳේ බැම්මේ හුණු කූරු වලින් සිතුවම් අඳිමින් ද ඒවා මකමින් යළි අඳිමින් පුහුණු වෙමින් ද බාලේ ගත කළ සැටි ඇය සමරන්නේ සොම්නසිනි. මව්බිම හැරදා එන විට ලිං බැම්මේ ලැකර් වලින් ඇය ඇඳි වැළපෙන ඇයගේම චිත්‍රය අදටත් නොමැකී එළෙසම ඇත්තේය. මව්බිම හැර විදේශ ගතවීමට තිබු



ඇයගේ අකමැත්තේ පිළිඹිබුවකි ඒ. අපි මංගලාට සුභ පැතුවෙමු. ඒ ඇයගේ නවතම තොරණට පමණක් ම නොවේ. ඇයගේ මුළු කලා දිවියටමයි.





